# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/4 | ඔබේ අංකය / உனது இல / Your Ref. | |
| දිනය / திகதி / Date | 2019.04. 17 | | |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 01-2019**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනා ලබා දීම</u>**

01. ඉහත කාර්ය සම්බන්ධව මා විසින් නිකුත් කර ඇති අංක CSS/7/6/3/2 දරණ 2015.07.20 දිනැති ලිපිය (ඇමුණුම් අංක-01) හා 2015.07.29 දිනැති ලිපියට(ඇමුණුම් අංක-02) අතිරේක වශයෙනි.

02.උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2018.02.20 දිනැති අංක 18/2015(II) දරණ චක්‍රලේඛය සම්බන්ධයෙනි.(එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)මෙම චක්‍රලේඛය මඟින් 2015.07.13 දිනැති අංක 18/2015 (I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ පළමුවන ඡේදයේ සඳහන් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට විශේෂ දීමනා ගෙවීමේ දී විධායක සේවා ගණයේ තනතුරක සිට තවත් විධායක සේවා ගණයේ තනතුරකට විධිමත් පරිදි මුදා හැර ඇති සහ සේවා ඛණ්ඩනයක් නොමැතිව නව තනතුරේ වැඩ භාර ගෙන ඇති නිලධාරීන්ට පූර්ව සේවා කාලය ද අදාල කර ගනිමින් එකී දීමනාව ගෙවීමට 2017.10.31 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇති බව සඳහන් කර ඇත.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2015(II) දරණ චක්‍රලේඛය, පහත දැක්වෙන කොන්දේසියට යටත්ව, දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/6/3/1 දරණ 2019.03.22 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

" කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2016 ට අනුව ව්‍යාපෘතියකට පූර්ණකාලීනව නිදහස් කළ රාජ්‍ය සේවයේ නිලධාරීන්ට සේවා කාලය පදනම් කරගෙන 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 18/2015 හා 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 18/2015(I) හි විධිවිධාන ප්‍රකාරව ගෙවනු ලබන විශේෂ දීමනාව ලබා ගැනීමට හිමිකමක් නොමැත."

04. තවද මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන දැනුවත් කරන ලෙසද දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

( ඇමුණුම 409 - 01 )

(48)


# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/6/3/2 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.07 28 |

දකුණු පළාතේ
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2015 හා 2015.06.26 දිනැති ලිපිය හා බැදේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එමඟින් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන් සඳහා විශේෂ දීමනාවක් 2015.07.01 දින සිට ගෙවීමට තීරණය කර ඇත.

03. ඒ අනුව අංක 18/2015 චක්‍රලේඛය පරිදි රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධාරීන් සඳහා විශේෂ දීමනාව 2015.07.01 දින සිට ගෙවීමට එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට අණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8 – 4 හා 2015.07.17 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වමි.

සුනිල් දහනායක,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.

පිටපත් :-

1. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව - දැ.ගැ.ස.
3. අයවැය අධ්‍යක්ෂ , දකුණු පළාත් සභාව - අ.ක.ස.
4. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ , දකුණු පළාත් සභාව - අ.ක.ස.

(ඇමුණුම 409 - 02)

74

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/6/3/2 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.07.29 |

දකුණු පළාතේ සියළුම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත

## රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2015 (i) හා 2015.07.13 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.).

03. එම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2015(i) හි සඳහන් පරිදි රාජ්‍ය සේවා විධායක සේවා ගණයේ නිලධාරීන්ට සේවා කාලය පදනම් කර ගනිමින් විශේෂ දීමනාව ලබා දීම සඳහාත් එම සංශෝධිත චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8-4 හා 2015.07.24 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වමි.

ජී.වික්‍රමසිංහ,

මුදල් අධ්‍යක්ෂ,

ප්‍රධාන ලේකම් වෙනුවට,

දකුණු පළාත.

o/c

2015.07.29

පිටපත්

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය : දැ.ගැ.ස.
03. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය : අ.ක.ස.
04. අයවැය අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය : අ.ක.ස.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2015 (II)

මගේ අංකය: EST-7/ALLOW/03/121Vol.04
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.02.20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබාදීම

2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 හා 2015.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(I) කෙරෙහි කාරුණික අවධානය යොමුකරවමි.

02. ඒ අනුව එහි පළමුවන ඡේදයේ සඳහන් විධායක ශ්‍රේණියේ විශේෂ දීමනා ගෙවීමේ දී විධායක සේවා ගණයේ තනතුරක සිට තවත් විධායක සේවා ගණයේ තනතුරකට විධිමත් පරිදි මුදාහැර ඇති සහ සේවා බණ්ඩනයක් නොමැතිව නව තනතුරේ වැඩ භාරගෙන ඇති නිලධරයන්ට පූර්ව සේවා කාලය ද අදාළ කරගනිමින් එකී විශේෂ දීමනාව ගෙවීමට 2017.10.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# ஆளுநர் செயலகம்
# GOVERNOR'S SECRETARIAT

**දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල**
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.


මගේ අංකය / எனது இல / My No. } G/SP/1/6/3/1

ඔබේ අංකය / உமது இல / Your No: }

දිනය / திகதி / Date } 2019.03. 22

27 MAR 2019
ප්‍රධාන ලේකම් දකුණු පළාත.

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

**<u>රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා ගැනීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතන ලද ඔබේ අංක CSS/7/6/3/2 හා 2019.02.02 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ඔබගේ CSS/7/6/3/2 හා 2018.03.26 දිනැති ලිපියෙන් ඉදිරිපත් කරන ලද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ ලේකම්ගේ අංක 18/2015(11) දරන එම චක්‍රලේඛය, පහත සඳහන් කොන්දේසියට යටත්ව දකුණු පළාතට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.03.12 වන දින ලබා දුන් බව කාරුණිකව දන්වා සිටිමි.

03. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයද සැලකිල්ලට ගෙන , කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2016 ට අනුව ව්‍යාපෘතියකට පූර්ණ කාලීනව නිදහස් කල රාජ්‍ය සේවයේ විධායක නිලධරයන්ට සේවා කාලය පදනම් කරගෙන 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 හා 2015.07.13 දිනැති රාජ්‍ය පරිපාලන 18/2015(1) හි විධිවිධාන ප්‍රකාරව ගෙවනු ලබන විශේෂ දීමනාව ලබා ගැනීමට හිමිකමක් නොමැති බව වැඩිදුරටත් දන්වමි.

**ඩබ්ලිව්.යූ.පී. ප්‍රේමචන්ද්‍ර**
**ආණ්ඩුකාර ලේකම්**
**දකුණු පළාත.**

**ඩබ්ලිව්.යූ.පී. ප්‍රේමචන්ද්‍ර**
ආණ්ඩුකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
පහළ ඩික්සන් පාර
ගාල්ල

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2015(I)

මගේ අංකය : EST/8/ALLOW/03/121 vol.04
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.07.13

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 කෙරේ ඔබගේ අවධානය යොමු කරවන අතර එහි පළමුවන ඡේදයේ සුදුසුකම් ලබන නිලධරයන් සඳහන් වගුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| සුදුසුකම් ලබන නිලධරයන් | | මසකට දීමනාව |
|---|---|---|
| (අ) | විධායක සේවා ගණයේ වසර 06කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 3000/- |
| (ආ) | විධායක සේවා ගණයේ වසර 06ක් හෝ එයට වැඩි සහ වසර 11ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 5000/- |
| (ඇ) | විධායක සේවා ගණයේ වසර 11ක් හෝ එයට වැඩි සහ වසර 19ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු.10000/- |
| (ඈ) | විධායක සේවා ගණයේ වසර 19ක් හෝ එයට වැඩි සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු.15000/- |

මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2015

මගේ අංකය : EST/8/ALLOW/03/121 vol.04

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම

රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන් සඳහා 2015.06.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂ දීමනාවක් 2015.07.01 දින සිට ගෙවීමට තීරණය කර ඇත.

| සුදුසුකම් ලබන නිලධරයන් | | මසකට දීමනාව |
|---|---|---|
| (අ) | විධායක සේවා ගණයේ වසර 06කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 3000/- |
| (ආ) | විධායක සේවා ගණයේ වසර 06ක් හෝ එයට වැඩි සහ වසර 11ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 5000/- |
| (ඇ) | විධායක සේවා ගණයේ වසර 11ක් හෝ එයට වැඩි සහ වසර 19ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත පළමු ශ්‍රේණියේ හෝ එයට ඉහළ ශ්‍රේණියක නිලධරයන් | රු.10000/- |
| (ඇ) | විධායක සේවා ගණයේ වසර 19ක් හෝ එයට වැඩි සක්‍රීය සේවා කාලයක් සහිත පළමු ශ්‍රේණියේ හෝ එයට ඉහළ ශ්‍රේණියක නිලධරයන් | රු.15000/- |

02. එක් එක් සේවාවන්හි සුවිශේෂීත්වය වෙනුවෙන් දැනට විශේෂ දීමනාවක් ලබා දෙන්නේ නම් එකී සේවාවල නිලධරයන්හට මෙම දීමනා හිමි නොවේ. තව ද එකී සේවාවන්හි නිලධරයන්හට ගෙවනු ලබන එම දීමනාව, ඉහත (අ), (ආ), (ඇ) හෝ (ඈ) යටතේ සුදුසුකම් ලබන නිලධරයන්හට ගෙවනු ලබන දීමනාවට වඩා අඩු දීමනාවක් නම්, එම දීමනා ලබන්නන්හට දැනට ලබන දීමනාව සහ ඉහත (අ), (ආ), (ඇ) හෝ (ඈ) හි සඳහන් දීමනා අතර පවතින වෙනස පමණක් ගෙවනු ලැබිය යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රිය පාලනය පිළිබඳ අමාත්‍යාංශය